බිලූවිප් ඉන්ටර්.නැෂනල්		1	0	2002		739,173.16
ජේ.ඩී.සී. ප්‍රින්ටින් ටෙක්නොලොජීස්		1	0	2002	11	116,154.00
නීට් ලංකා සුද්. සමාගම		1	0	2102	11	34,600.00
සොෆ්ට්ලෙන්ජික් ඉන්ෆොමේෂන්		1	0	2103	11	187,000.00
ග්‍රැෆික් රීක්විප්මන්ට් ඇන්ඩ් සර්.විසස්		1	5	2103	11	16,213,428.60
ඩබ්.ඒ.එස් බුද්ධිකා පෙරේරා		1	1	1409	11	4,405.00
එම්.කීඩරානි සුනීතා		1	0	1202	11	3,432.00
යුනිකෙයාර් සර්විස්		1	0	1409	11	1,614,625.17
ඔෆිස් කොච්චි		1	0	1409	11	15,120.00
කෙකෝ ක්ලින්		1	1	1409	11	639,410.00
අසොසියටෙඩ් නිවුස් පේපර්ස්		1	1	1409	11	355,144.50
අසිදුවා ටෙක්නොලොගීස්		1	0	2002	11	395,820.00
දුල්මා එයාර් කන්ඩිශනින්ග්		1	0	1409	11	150,352.00
ජෝන් කීල්ස් ඔෆිස්		1	0	1302	11	455,699.20
ක්‍රාප්ට් ලංකා		1	0	1302	11	12,420.00
සිලෝන් බීස්නාස්		1	0	1302	11	41,580.00
සිවිල් සේකුරිටි සර්විස්		1	0	1409	11	304,100.00
ඔටෝ එයාර්		1	0	2003	11	96,500.00
ඒ.ක්‍රිෂ්නගොපි		1	0	1202	11	4,160.00
ගදසාර්තමේන්තුවේ නිලධාරීන් හට		1	0	2401	11	303,500.00
පී.ඒ.ආරියදාස		1	0	1301	11	562,843.92
ජිෂන් ඔටෝ රෙපෙයාර්		1	0	1301	11	143,035.00
ඔටොයෝඩා ලංකා		1	0	1301	11	70,102.19
විජේරාම සර්විස්		1	0	1301	11	98,895.00
සංජීව මෝටර්ස්		1	0	1301	11	35,524.00
වන්දසිරි මෝටර්ස්		1	0	2003	11	149,600.00
දිනේෂ් වන්දනා		1	0	1409	11	57,750.00
සොෆ්ට් ලොජික් රිටේල්		1	1	1409	11	394,499.99
ඩයලොග් අසියාටා		1	0	1402	11	6,748.89

මොබිටෙල්		1	0	1402	11	36,520.02
සතොස මෝටර්ස්		1	0	1301	11	79,845.24
ඊ.ඩබ්ලිව් ඉන්ෆොර්මේෂන්		1	0	1302	11	11,050.00
ඉන්දික මෝටර්ස්		1	0	2003/1301	11	732,060.00
සංජීව මෝටර්ස්		1	0	2003	11	153,879.00
චන්ද්‍රසිරි මෝටර්ස්		1	0	1301	11	199,750.00
ඩීසල් ඇන්ඩ් මෝටර් එන්ජිනියරින්ග්		1	0	2003	11	304,895.00
එන්.වී ඔටෝ එන්ජිනේයරින්ග්		1	0	1301	11	125,049.00
නිට් ලංකා		1	0	1302	11	11,310.00
එකතුව						29,153,745.76
මුළු එකතුව						859,106,632.02

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2021-02-24

[illegible]

සටහන-(vi)

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය :02

		රු.
(1)	ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2020 ඇස්තමේන්තුගත වෙන්කිරීම්	නැත
(2)	ඉහත (1) ට අදාළ 2020 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම	නැත
(3)	2020 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව	නැත
(4)	2019 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2020 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (ඇත්නම්)	නැත
(5)	2020 වර්ෂය සම්බන්ධයෙන් 2020 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව	නැත
(6)	2019 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2020 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව	නැත
(7)	2020 වර්ෂය සම්බන්ධයෙන් 2020 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව	නැත
(8)	2019 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2020 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව	නැත
(9)	2020 වර්ෂය වෙනුවෙන් 2020 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	නැත
(10)	2020 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව {(3+4+5) - (6+7) }- (8+9)	නැත
(11)	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2020 වර්ෂය සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව	නැත
(12)	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2020 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	නැත
(13)	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (10 + 11 - 12)	නැත

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ (මුදල්) / කොමසාරිස් (මුදල්)

දිනය 2021-02-24

ඩී. එන්. ඒ. කෙට්ටිආරච්චි
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

සටහන-(vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම:ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය:212

වැඩසටහන් අංකය හා නාමය:02

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		නැත		

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2021-02-24

ඩී. එන්. කේ. හෙට්ටිආරච්චි
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

53

සටහන-(viii)

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වනුලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2020.12.31 දිනට තත්ත්ව වාර්තාව

විශයම ශීර්ෂ අංකය:212 දෙපාර්තමේන්තුවේ නම:ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2020.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2020.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2020.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	ලංකා බැංකුව	7041225	3000.00	0.00	නැත	දෙසැම්බර් 2020
2	ලංකා බැංකුව	7041226	3000.00	0.00	නැත	දෙසැම්බර් 2020
3	ලංකා බැංකුව	7041227	3000.00	0.00	නැත	දෙසැම්බර් 2020
4	ලංකා බැංකුව	7041228	3000.00	0.00	නැත	දෙසැම්බර් 2020
5	ලංකා බැංකුව	7041229	3000.00	0.00	නැත	දෙසැම්බර් 2020
6	මහජන බැංකුව	100169026223	0.00	0.00	නැත	දෙසැම්බර් 2020

ඉහත සඳහන් කොරතුරු සත්‍ය හා නිවැරදි බවට කහවුරු කරමි.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2021 . 02 . 24

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.03.02.13	විභාග හා අනෙකුත් ගාස්තු	350,000,000	300,000,000	311,718,845	103.90%

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	4,857,810,000	4,857,810,000	3,504,162,871	72.13%
ප්‍රාග්ධන	502,500,000	502,500,000	79,310,703	15.78%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගිතා ප්‍රගතිය
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
01.	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	-	-	-	520,525.00	-
02.	ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව	තැපැල් වියදම්	-	19,781,920.00	19,388,413	98%
03.	අධ්‍යාපන අමාත්‍යාංශය	විභාග සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම්	-	99,209,459.00	79,651,088	80.28%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යූහයන්	-	1,784,998,684.18		
9152	යන්ත්‍රෝපකරණ	-	704,477,172.86		
9153	ඉඩම්	-	630,000,000.00		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	-	202,247,743.89		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ඊඒයු/සී/ඊපීසී/එප්ජ්/1/20
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2021 ජූලි 5 දින

කොමසාරිස් ජනරාල්
විභාග දෙපාර්තමේන්තුව

විභාග දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තක්ක්වාගණනය කළ මතය

විභාග දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම්, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 ආදායම් නොවන ලැබීම්

ගිහ විභාග ආදායම් ශේෂය රු.1,509,792 ක් ලෙස ගිණුමේ දක්වා තිබූ අතර ඒ තුල ඉකුත් වර්ෂයට අදාල රු.637,430 ක් හා 2018 වර්ෂයට අදාල රු.197,383 ක් ඇතුලත්ව තිබුණි.

1.6.1.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් 07කට අදාලව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස දක්වා ඇති වටිනාකම සහ ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ සමග නොගැලපීම් තත්වයක් නිරීක්ෂණය වුවද ඊට හේතු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තු මුද්‍රණ අංශය වෙත මිලදී ගනු ලැබූ රු.546,264,452 ක් වටිනා Wide Web Digital මුද්‍රණ යන්ත්‍රය වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි.

1.6.1.3 තැන්පතු ගිණුම් ශේෂ

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු තැන්පතු ගිණුම් 04 ක රු.67,677,090 ක් වූ ශේෂයක් වූ අතර තුළ අවුරුදු 2-5 ත් අතර කාල සීමාවට අදාළ ශේෂය 5,257,546 ක් විය.

(ඇ) රැඳවුම් මුදල් (6000-0-0-1-77/0000) ගිණුමේ වර්ෂ 02 ක් ඉක්මවූ රු.4,739,403 ක් වූ ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) ටෙන්ඩර් තැන්පතු (6000/0-0-0-2 /105/000) වසර 2 ක් ඉක්ම වූ රු.234,951 වූ තැන්පතු ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

1.6.1.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනය , මුදල් රෙගුලාසි 751 ප්‍රකාරව විදුලි උපකරණ ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

වාර්ෂික අවශ්‍යතාවයන් අනුව ඇස්තමේන්තු සකස් කර නොතිබීම හේතුවෙන් වැය විෂයයන් 04 කම රු.129,600,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) හි යම් මුදල් වර්ෂයට අදාල සියළු බැරකම් එම මුදල් වර්ෂය තුලදී නිරවුල් කිරීමේ අරමුණෙන් ඉදිරියට ගෙන නොයා යුතු බවත් සඳහන් කර ඇතත් දෙපාර්තමේන්තුව 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල රු.859,106,632ක බැරකම් ද රු.859,071,982 ක බැදීම් ද ඇති කර ගෙන තිබුණි.

(ආ) නිල නිවාස 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.17,820,562 ක් සමාලෝචිත වර්ෂයේ බැරකම්වල ඇතුලත් කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර පොත් අනුව වගකීම් යටතේ රු.965,000,000 ක් දැක්වුවද දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල වගකීම් ශේෂයක් දක්වා නොතිබුණි.

2.5 නීති ,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 94 (i) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇන්නම් මිස කිසිදු වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳිය යුතු වුවත් වැය විෂයයන් 08 ක් සඳහා රු. 10,157,120 ක ඉතිරිවීම් ඉක්මවා බැරකම් සඳහා බැදීම් ඇති කරගෙන තිබුණි.

2.6 අවිධිමත් ගනුදෙනු

ප්‍රසිද්ධ විභාගවල නිරත වන නිළධාරීන්ට ගාස්තු ගෙවීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙපාර්තමේන්තුවේ ඉල්ලීම අනුව රාජ්‍ය පරිපාලන ආපදා කළමණාකරන සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ විසින් 2019 ඔක්තෝම්බර් 03 දිනැති අංක EST/07/EXAMS/05/2018 මගින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන ප්‍රසිද්ධ විභාග කටයුතුවල නියැලෙන නිලධාරීන් සඳහා 2019/10/03 දින සිට ඉදිරි වර්ෂ 05 ක කාලයක් සඳහා

ඉදාල කර ගැනීමේ කොන්දේසි වලට යටත්ව ගාස්තු සංශෝධනය කර තිබුණි. එසේ වුවද අනුමත සංශෝධිත ගාස්තු කාර ඇති දීමනා ගෙවීම් 2020 දෙසැම්බර් 31 දින වන විට ද ක්‍රියාත්මක නොකර පැරණි දීමනා ගාස්තු පොතට අනුව ගෙවීම් කර තිබුණි.

(ආ) අළුත් ගාස්තු පොතෙහි ඡේද 01 ට අනුව රහස්‍ය ලේඛන කටයුතුවල යෙදීම වෙනුවෙන් ගෙවනු ලබන මාසික රහස්‍ය දීමනාව වසරකට උපරිම මාස 06 කට ගෙවිය යුතු වුවද මාසික රහස්‍ය දීමනාව මාස 12 කට අදාල රු.628,456ක් අදාල නිලධාරීන්ගේ මාසික වැටුපට එකතු කර ගෙවා ඇති අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) පරණ ගාස්තු පොත අනුව ගෙවීම් සිදු කල ද ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාවේ 2012/04/10 දිනැති NSCC/1/34/1/CM ලිපියේ (ආ) නිර්දේශ (iii)ට අනුව කමිටුව විසින් යෝජනා කරන ලද ගාස්තු ව්‍යුහය නොඉක්මවන පරිදි හා නිර්දේශිත දීමනා ප්‍රමාණය නොඉක්මවන පරිදි ඒ පිළිබඳ අවසාන තීරණය ගැනීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් වෙත ලබා දී තිබුණ ද ඊට පටහැනිව අභ්‍යන්තර මෙමෝ පත්‍ර මගින් ගෙවීම් සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

(ඈ) දත්ත සටහන් ශාඛාවේ දත්ත ඇතුලත් කිරීමේ හා නඟවුරු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය වෙනුවෙන් දීමනා ගෙවීම අනුමත කර නොතිබුණි. ඊට පටහැනිව වවුචර් අංක A06*68 යටතේ ශාඛා නිලධාරීන් වෙත වෙත රු. 21,200ක් ගෙවා තිබුණි.

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන දේශන වැඩ මුළු පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන් වෙනුවෙන් සම්පත් දායකත්වය ලබා දෙන නිලධරයන් සඳහා පමණක් සම්පත් දායක දීමනා ගෙවීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල් අනුමත කර තිබුණ ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන වැඩ මුළු සඳහා ආයතනයේ අභ්‍යන්තර සේවකයන් සඳහා ද නිසි අධිකාරි බලයකින් තොරව ගෙවීම් සිදු කර තිබුණි.

5. මෙහෙයුම් සමාලෝචනය

5.1 කාර්යසාධනය

සහතිකපත්‍ර ශාඛාව විසින් 1992 වර්ෂයේ සිට පැවති විභාගවල ප්‍රතිඵල පරිගණක පද්ධතියට ඇතුලත් කර ඒ හරහා සහතික නිකුත් කරනු ලබයි .නමුත් 1992 වර්ෂයට පෙර දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා පරිගණක පද්ධතියට තොරතුරු ඇතුලත් කිරීම ආරම්භකර තිබුණ ද 2021 ජුනි දක්වාම පරිගණක පද්ධතිය මගින් ප්‍රතිඵල නිකුත් කිරීමට හා සනාථ කිරීමට නොහැකි වී තිබුණි.

3.1.1 දැක්ම හා මෙහෙවර

රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් අනුමත කාල සටහනකට අනුව දිවයින පුරා දිවා කාලයේ අ.පො.ස (සා.පෙළ) විභාගය සහ අ.පො.ස (උ.පෙළ) විභාග පැවැත්වීම සඳහා අවශ්‍ය සියළුම කටයුතු සංවිධානය කරනු ලබයි.

බාහිර පාර්ශවයකින් විභාග කොමසාරිස්වරයා කරන ලද ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකාවේ පවතින එක්කරා ආගමික ආයතනයකට අයත් සිසුන් සුළු පිරිසකට පමණක් දිවා කාලයේ ආගමික කටයුතු වල යෙදීමටත් සාමාන්‍යයෙන් විභාග පැවැත්වෙන වෙලාවෙන් පැය 9 කට පසුව එම සිසුන්ට එම විභාගවලට පෙනී සිටීමටත් අවස්ථාව ලබා දී තිබුණි. තවද 1970 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වාර්ෂිකව නොකඩවා සබත් දිනය ලෙසින් හඳුන්වන සෙනසුරාදා දිනයන්වලදී පැවැත්වෙන අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) විභාගවල විෂයයන් වලට එම සිසුන්ට රාත්‍රී කාලයේදී පෙනී සිටීමට අවශ්‍ය සියළු කටයුතු විභාග කොමසාරිස්ගේ දැනුවත්භාවය මත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඉඩකඩ සලසා දී තිබුණි. බාහිර පාර්ශවයක ඉල්ලීමකට අනුව රාත්‍රී කාලයේ පවක්වා තිබුණු මෙම විභාගය සම්බන්ධයෙන් වරින්වර පත් වූ විභාග කොමසාරිස් ජනරාල්වරු ගරු විෂයභාර අමාත්‍යවරයා හෝ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කිරීමට හෝ ක්‍රියා නොකර නීතිමය ප්‍රතිපාදන නොමැති මෙම විභාගය පැවැත්වීමේ ක්‍රියාව අඛණ්ඩව වර්ෂ 50 ක පමණ කාලයක සිට සිදුකර තිබුණි.

1968 අංක 25 දරණ ප්‍රසිද්ධ විභාග පනතේ 6.1 වගන්තිය ප්‍රකාරව සාමාන්‍ය විභාග පැවැත්වෙන වෙලාවෙන් පසුව මෙලෙස සබත් දින විභාග පැවැත්වීම මගින් විභාග ප්‍රශ්න පත්‍රවල රහස්‍යභාවය කඩවී තිබේද යන්න ගැටළු සහගත විය.

මෙම විභාගයට සහභාගීවන දෙපාර්තමේන්තු නිලධාරීන් විභාග රාජකාරී දීමනා දෙපාර්තමේන්තු ශාස්තු පොතේ සඳහන් වටිනාකම මෙන් දෙගුණයක් බාහිර ආයතනියකින් සෘජුවම ලබා ගෙන තිබෙන බව අනාවරණය විය.

3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

2011 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් මතු වූ ගැටළු විමර්ශන කිරීම සඳහා පත් කරන ලද විද්වත් යෝජනාවකට අනුව 2017 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර 2019 පෙබරවාරි 02 අවසන් කිරීමට නියමිත සයමහල් බහු කාර්යය ගොඩනැගිල්ල රු. 564,320,835 ක කොන්ත්‍රාත් මුදලකට ඉංජිනේරු සංස්ථාව වෙත භාර දී 2020 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශයට රු.28,905,398 ක් ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව රු.280,625,748 ක් ගෙවා ඇතත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි.

3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව එකටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මුද්‍රණ ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණු අතර 2019 වර්ෂවලට අදාල වාර්තාවද 2021 මාර්තු 31 දින වීට ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.4 ප්‍රසම්පාදනයන්

ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සඳහා ඩිජිටල් ටර්න් කී මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රශ්න පත්‍රවල මනා නිමාවක් ලබා ගැනීම මඟින් විභාග අපේක්ෂකයින්ගේ විශ්වාසනීයත්වය නංවාලීම හා රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් රු.546,264,452 ක වියදමක් දරා මෙම මුද්‍රණ යන්ත්‍රය මිලදී ගෙන තිබුණ ද 2020 වර්ෂයේදී අ.පො.ස උසස් පෙළ ප්‍රශ්න පත්‍ර 346,180 ක් පමණක් මුද්‍රණය කල තිබුණි. එය සමස්ත ප්‍රශ්න පත්‍ර වලින් සියයට 5 ක තරම් අඩු ප්‍රතිශතයක් විය.

(ආ) තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරීන් විසින් විදේශියව සිදු කරන ලද භෞතික නිරීක්ෂණයෙන් අනතුරුව ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව ටර්න් කී මුද්‍රණ යන්ත්‍රයේ Wrapping Solution කොටස ප්‍රශ්න පත්‍ර වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය අංගයක් ලෙස නම් කර නිර්දේශ කර තිබුණු නමුත් මිලදී ගත් දින සිට රු.8,428,637ක් වටිනා මෙම කොටස කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිශ්කාර්යව පැවතුණි.

(ඇ) මෙම යන්ත්‍රයේ හදිසි විදුලි බිඳ වැටීමකදී මුද්‍රණ පද්ධතිය ක්‍රියා විරහිත (shutdown) වන තුරු විදුලි සැපයුම පවත්වාගෙන යාම සඳහා රු.7,096,000 පිරිවැයක් දරා කි.වෝ.160 ක අඛණ්ඩ බලසැපයුම් ඒකකයක් (UPS) මිලදී ගෙන තිබුණි. යන්ත්‍රය මිලදී ගෙන වසර 02 කට ආසන්න කාලයක් ගතවීමෙන් පසු මෙම අවශ්‍යතාවය හඳුනාගෙන නිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ප්‍රසම්පාදන අස්ථිත්වයේ වගකීම් යටතේ වන 2.3.2 (ඇ) පරිදි යන්ත්‍රය මිලදී ගැනීමට පිරිවිකර සකස් කිරීමේදී මෙම අවශ්‍යතාවය සැලකිල්ලට නොගැනීම නිසා රු.මිලියන 7කට වැඩි මුදලක් අමතර වැය කිරීමට සිදු වී තිබුණි.

3.5 **පාඩු හා හානි**

දෙපාර්තමේන්තු භාණ්ඩ පිළිබඳ ලේඛණයේ ඇතුලත් රු.616,740ක අනතුරු අලාභයන් 03 ක් සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.6 **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) දෙපාර්තමේන්තුව පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු630.,000,000 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණ ද එම ඉඩම මෙතෙක් දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2018 වර්ෂයේදී රු.28,500,000 ක් වැය කර සූර්යබල ශක්ති පද්ධතියක් ස්ථාපනය කර තිබුණ අතර පද්ධතියේ පවතින නිෂ්පාදන ධාරිතාවය හා පරිභෝජනය පිළිබඳ පවතින අපහැදිලි භාවය නිසා දෙපාර්තමේන්තුව විසින් පත්කල කමිටුවේ 2018 ඔක්තෝබර් 08 දිනැති තීරණය අනුව , සම්පූර්ණ විදුලි නිෂ්පාදනය විදුලි බල මණ්ඩලයට අලෙවි කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ඒ අනුව කටයුතු කර නොතිබුණි..

(ඇ) 2020 වර්ෂයේදී නිල නිවාස 03 ක් මිලදී ගැනීමට මූලික ගෙවීම ලෙස රුපියල් මිලියන තුනක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබූ අතර 2020 හා 2021 වර්ෂය සඳහා පිළිවෙලින් රු.17,820,562 ක් ද රු.13,880,374 ක් ද තවදුරටත් ගෙවිය යුතුව පැවතුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද එම ගෙවීම් සිදු කර නොතිබුණි. නියමිත දිනයන්හිදී ගෙවීමට අපොහොසත් වුවහොත් ගෙවීම් වලින් 25% ක් හෙවත් රු.750,000 ක් රඳවා ගෙන වෙන් කිරීම අවලංගු කිරීමට හෝ ඉඩ ඇති බව හා නිවාස සංවර්ධන අධිකාරී විසින් තීරණය කරනු ලබන ප්‍රමාද ගාස්තුවක් 12 % ක වාර්ෂික පොළියක් ද සමඟ ගෙවීමට සිදු වනු ඇති බව ගිවිසුම් කොන්දේසි 1.1 (B) න් සඳහන්ව තිබුණ ද මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2018 වර්ෂයේදී ශිෂ්‍යයන්ගේ ප්‍රායෝගික අත්දැකීම් හා ක්‍රියාකාරකම් මැන බැලීම අරමුණු ඇතිව 2019 ,2020 හා 2021 වර්ෂ වලදී රු. 128,359,865 ක වියදමක් දරා සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) විභාගය මාර්ගගත (online) ක්‍රමයට පවත්වා තිබුණද එහි ප්‍රතිඵල 2021 මාර්තු 31 දින දක්වා ලබා දී නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේදී සබත් දින අ.පො.ස සා.පෙළ හා අ.පො.ස. උ.පෙළ විභාග පැවැත්වීම සම්බන්ධයෙන් වූ අංක 19/IA/EX/05 දරන විශේෂ අභ්‍යන්තර විගණන වාර්තාව 2019 ජනවාරි 16 දින විභාග කොමසාරිස් ජනරාල් වෙත භාර දී ඇති බව ලිපිභාර දීමේ ලේඛනය අනුව සනාථ වුවද එම විමර්ශන වාර්තාව පරිශීලනය කර අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

(අ) අනියම් පදනමින් සේවය කල 82 දෙනෙකු සඳහා 2020 පෙබරවාරි 20 දින කා.කා.සේ III ශ්‍රේණියට ස්ථිර පත්වීම් ලබාදී ප්‍රාථමික මට්ටමට ඇතුලත් කර මාස 06 ක කාලයක් ස්ථිර වැටුප් ලබා දී ඇතත් විගණන දින වන විට ද එම නිළධාරින්ට ස්ථිර පත්වීම් ලිපි ලබා දී නොතිබුණි. එකී නිලධාරීන් අතුරින් 05 දෙනෙකු සේවය හැර ගොස් ඇති අතර ඔවුන්ට ගෙවන ලද රු.90,000 ක මුදල ආපසු අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගෙන තිබෙන 14 දෙනෙකුගේ සේවය ස්ථිර කර ගැනීමට කටයුතු නොකර 2021 වර්ෂයේදී තවදුරටත් අනියම් පදනමින් 15 දෙනෙකු බඳවා ගෙන තිබෙන අතර සමස්ථ අනුමත සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 29 ක් බඳවා ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 152 ක් පවතින අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 12 ක් හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 12 ක් පැවතිය ද එම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

P. H. [signature]

එම්.අයි.පුෂ්පා හේමමාලි
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	**89% - 75%**	**74% - 50%**	**49% - 0%**
ජාතික මට්ටමේ පාසල් විභාග සංවිධානය හා පැවැත්වීම (5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ)			60%	
ආයතනික විභාග පැවැත්වීම				38%
සහතිකපත්‍ර නිකුත් කිරීම හා ප්‍රතිඵල සත්‍යාපනය කිරීම - සහතිකපත්‍ර නිකුත් කිරීම - ප්‍රතිඵල සත්‍යාපනය කිරීම	97% 94.5%			
නව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම		80%		

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 / 5.2 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රතිඵල සටහනක් බාගත කිරීම සහ එම ප්‍රතිඵල තහවුරු කර ගැනීමේ පහසුකම සැලසීම (Verification of Results)	අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග සඳහා මෙම පහසුකම සැලසීම	විභාග ප්‍රතිඵල තහවුරු කර ගැනීමේ පහසුකම අයදුම්කරුවන්, පෞද්ගලික ආයතන, විදේශීය ආයතන සහ විශ්ව විද්‍යාල සඳහා ලබාදීම			✓
සෑම ශිෂ්‍යයෙකුටම ජාතික ශිෂ්‍ය අනන්‍යතා අංකයක් ලබාදීම (National Student Identity Number)	5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා ශිෂ්‍ය අනන්‍යතා අංකයක් ලබාදීම තුළින්, අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගවලට පෙනී සිටින අවස්ථාවලදී එම අනන්‍යතා අංකයම භාවිතා කළ හැකි වීම. එමගින් ශිෂ්‍යයා පිළිබඳ තොරතුරු නියාමනය පහසු වීම	2020 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා ප්‍රථමවරට ජාතික ශිෂ්‍ය අනන්‍යතා අංකයක් සෑම සිසු සිසුවියකටම ලබා දීම			✓
සම්පත් පුද්ගල සංචිත සඳහා දත්ත පාදමක් (Data Base) සකස් කිරීම	අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශ්ව විද්‍යාල, ජාතික අධ්‍යාපන ආයතනය, විද්‍යා පීඨ, ගුරු විද්‍යාල, කාර්මික විද්‍යාල, පාසල් ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල කථිකාචාර්යවරුන්/ගුරුවරුන් සහ නිලධාරීන්, එම ආයතනවල සේවය කළ විශ්‍රාමික නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පාදමක් සකස් කිරීම	අ.පො.ස. (උ.පෙළ) 15,000 ක්, අ.පො.ස. (සා.පෙළ) 30,000 ක් සහ ආයතනික විභාග සඳහා 1500 ක් පමණ නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පාදමක් සකස් කිරීමට හැකියාව ලැබීම		✓	

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	89	**77**	12 (හිඟ)
තෘතීයික	26	**14**	12 (හිඟ)
ද්විතියික	449	**321**	128 (හිඟ)
ප්‍රාථමික	209	**140 (ස්ථිර) + 83 (තාවකාලික) 223**	69 (ස්ථිර)

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

උක්ත 6.1 හි සඳහන් පරිදි මානව සම්පත් හිඟයක් පැවතියද, දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට බලපෑමක් නොවන අයුරින් දැනට පවතින මානව සම්පත දෙපාර්තමේන්තු රාජකාරි සඳහා යොදවා ගැනීමට දෙපාර්තමේන්තු පරිපාලනය සමත් ව ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
අ.පො.ස. (උ/පෙළ) විභාගයේ සම්පත් පුද්ගල නිලධාරීන් සඳහා ප්‍රශ්නපත්‍ර හා ලකුණු දීමේ පටිපාටි සකස් කිරීම සම්බන්ධ වැඩමුළුව (වැඩමුළු 05)	සම්පත් දායකයින් 112	දින 02	4,100	-	දේශීය	• පුහුණු පරීක්ෂණ සංවර්ධකයින් • ගුණාත්මක ප්‍රශ්න පත්‍ර
අතිරේක සහකාර ශාලාධිපතිවරු පුහුණු කිරීම සම්බන්ධ වැඩමුළු (වැඩමුළු 10)	1423 (SLPS/ SLTS/ කැඩෙට් නිලධාරීන්)	දින 01	3,100	-	දේශීය	පුහුණු විභාග අධීක්ෂක සංචිතය
පරිගණක පදනම් කරගත් දත්ත විශ්ලේෂණය සඳහා පුහුණු වැඩසටහනක් (CBDA)	මාණ්ඩලික නිලධාරීන් 04	පැය 39 (සති 09)	148	-	දේශීය	පරිගණක පදනම් කරගත් දත්ත විශ්ලේෂණ කුසලතා ඇති මාණ්ඩලික නිලධාරීන්

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**	
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පැවරීම	අනුකූල වේ
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**	
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ
5	**විගණන විමසුම්**	
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ
6	**අභ්‍යන්තර විගණනය**	
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	කොවිඩ් 19 හේතුවෙන් කාර්යාල වසා තැබීමට සිදුවීම නිසා විගණන කළමනාකරණ කමිටු 02ක් පවත්වන ලදී. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අංක DMA/AMC/M/2020 /5-4 හා 2020.06.11 දිනැති ලිපිය අනුව විගණන කළමනාකරණ කමිටු 02ක් පැවැත්වීම ප්‍රමාණවත් බව දන්වා ඇත.	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නිකුත් කරනු ලබන උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීම.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**		
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	-	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	
11	**ප්‍රතිපාදන උපයෝජනය**		
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	-	
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**		
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අයකරමින් පවතී
13	**පොදු තැන්පත් ගිණුම**		
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	
14	**අග්‍රිම ගිණුම**		

14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ
15	**ආදායම් ගිණුම**	
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ
16	**මානව සම්පත් කළමනාකරණය**	
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**	
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**	
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**	
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**	
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ